# ලක්දිව සිංහල ස්ථාන නාම භාවිතය අත්‍යවශ්‍යයි!

(මෙහි 1 වන කොටස ගිය කලාපයේ පළවිය)

## සිංහල ස්ථාන නාමයන් භාවිතා කළ යුත්තේ ඇයි ?

සිංහල ස්ථාන නාම භාවිතයේ වැදගත්කම වූ කලී බොරු දෙමළ නිජබිම් සංකල්පයක් මවා, ඒ තුළින් අපේ කුඩා දිවයින කැබලිවලට කඩා දෙමළ රාජ්‍ය යක් ගොඩ නැගීමේ ඊළම් වාදී උත්සාහය පරාජය කර, අප දේශයේ ඒකීය භාවය සුරැකීම සඳහා අත්‍යවශ්‍ය මූලාධාරයක් වීම පමණක් නොවේ. සිංහල බෞද්ධ උරුමයන් වනසා දැමීමේ කූට දෙමළ උපක්‍රමයන් අහෝසිකර දැමීමේ ප්‍රබල අංග යක් වශයෙන්ද සිරිලක පුරා සිංහළ ස්ථාන නාම යන් දිගටම භාවිතා කිරීම අවශ්‍යම දෙයක් වන්නේය. එසේ කිරීමෙන් උතුරු නැගණහිර දෙමළ නිජබිමක් නොවන බැව් ඉන් සනාථ වන අතර, ලොව පුරා වෙසෙන දෙමළ අයට එවැනි නිජබිම-ක් තමනට ශ්‍රීලංකාවේ තිබෙන බව කියමින් ජාත්‍යන්තර ප්‍රජාව රවටන්නට හැකිවන්නේද නැත.

දකුණු ඉන්දියාවෙන් ශ්‍රීලංකාවට පැමිණි සතුරු ආක්‍රමණිකයන් විසින් වරින් වර කරන ලද මහත් විනාශයන් කෙසේ වෙතත් වසර දෙදහස් තුන් සීයකට අධික කාලයක සිට අප දිවයින බැබළ වූ දහස් සංඛ්‍යාත බෞද්ධ සිද්ධස්ථාන උතුරෙහි ද නැගණහිරෙහිද එකසේ පැවතුණි. වරින්වර සිදුවූ චෝල පාණ්ඩ්‍යය යනුවෙන් ඉතිහාසයේ හැඳින් වෙන දෙමළ අක්‍රමණිකයන් විසින් විනාශකර දමන ලද දහස් ගණන් බෞද්ධ සිද්ධස්ථානයන්ගේ නටබුන් තවමත් එමටය. පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමින් යුක්තවූ ද, සිංහළ බෞද්ධ උරුමයට සාක්ෂි දරන්නාවූ ද මෙම ඉපැරණි සිද්ධස්ථාන හා නටබුන් තවමත් දෙමළ ත්‍රස්තවාදීන් විසින් විනාශකරනු ලබමින් පවතී.

## නාගදිපය එදා සමස්ථ යාපා පටුන ම ද?

යාපාපටුන නොහොත් නාගදීපය සහ තවත් කුඩා ප්‍රමාණයේ දූපත් රැසකින් වටවූ වර්තමාන යාපන අර්ධද්වීපය ආදි කාලීන ලක්දිව ඉතාම වැදගත් සිංහළ බෞද්ධ මධ්‍යස්ථානයක් වූවා නිසැකය. එදා යාපාපටුන අනුරාධපුරය වැනි පූජණීය මධ්‍ය ස්ථානයක් වූ බවට පුරාවිද්‍යා කරුණු එමටය.

කිතුවසින් 523 වසරකට පෙර තෙවරක්ම ලක්දිවට පැමිණි ගෞතම බුදුරජාණන්වහන්සේගේ දෙවැනි ලංකා ගමනය සිදුවූයේ නාගදීපයට බැව් සඳහන් වේ. චුලෝදර (කුඩාබණ්ඩා) සහ මහෝදර (මහ බණ්ඩා) යන නාග ගෝත්‍රික කුමරුවන් දෙදෙනා දබරවී සටනට එළඹීම නැවැත්වීම පිණිස බුදුන්-වහන්සේගේ මෙකී පැමිණීම සිදුවූ බව ද ප්‍රකටය. එම වැඩමවීම කෙරෙන්නට ඇත්තේ අද දෙමළ ජනයා **නයිනතිවු** නමින් හැඳින්වෙන කුඩා නාගදීප දූපතට නොව එම නාගගෝත්‍රික රාජධානියට නැත්නම් රජ මාළිගයට හෝ එම අංගනයට බව සැලකීම වඩා සුදුසුය. එකල එම දූපත ජන සූන්‍ය දිවයිනක් වන්නටද ඇති බැවින් උන්වහන්සේ එම දූපතට දිවාවිහරණය සඳහා හෝ වඩින්නට ඇතැයි සිතිය හැක.

ඒ කෙසේ වුවද ඉන් සිය වස් ගණනක් ගතවී ලක්දිව බුදුසසුන පිහිටුවීමෙන් පසු ශ්‍රීමහාබෝධි ශාඛාව ශ්‍රීලංකාවට ගෙන ඒමද ඊටත් තවත් වසර ගණනකට පසුව ශ්‍රී දළදා වහන්සේ උතුරු දිග නැව්තොටින් (දඹ කොල පටුනින්) ලක්දිවට ගෙන ඒමෙන් අනතුරුවද කලින් කල ඒ පරිසරයේ සිය දහස් ගණන් බෞද්ධ සිද්ධස්ථාන ඉදිවූ බැව් ඒ ප්‍රදේශය පුරා ඇති නටබුන් රාශියෙන් පෙනී යයි. එසේම යාපනය වටා ඇති කුඩා දූපත් වල ද ඉපැරණි බෞද්ධ නටබුන් සොයාගෙන ඇත.

මෙම ස්ථානයන් හැඳින්වූ පැරණි සිංහළ නාම යන් දෙමළට හරවා දෙමළ ඊළාමයක් ගොඩ නැගීමේ අරමුණින් මිනීමරු ත්‍රස්තවාදී ක්‍රියාවෙන් එය ජයගැනීමට දෙමළුන් වලිකන මෙවැනි යුගයක රටේ ඒකීය භාවයට හා සිංහළයාගේ බෞද්ධ සංස්කෘතික පරිසරයට ඇති හිමිකම විනාශකර දැමීමට කෙරෙන දෙමළ ජාතිවාදයෙන් සිය මවුබිම මුදාගැන්ම සිංහළයින්ට දැන් පැවරී ඇති කාර්යභාරයකි. එය කිසිසේත් පැහැර නොහැරිය යුතු ය. සිංහළ ස්ථාන නාම යළි තහවුරු කළහැක්කේ ඒවා නිතර භාවිතා කිරීමෙන් පමණි.

## පුරාවිද්‍යා කැණිම්

යට කියන ලද යාපා පටුනේ වැදගත් තත්වය පසු කාලවලදී යාපනයට පමණක් සීමාවන තැනට කලින් කල සිදු වූ හින්දු දෙමළ ආක්‍රමණිකයන් ක්‍රියාකරන්නට ඇති බව නිසැක ය. යාපා පටුන පුරා බෞද්ධ නශ්ඨාවශේෂ ඇති බැවින් එම අර්ධද්වීපයේ කැණීම් ඇරඹීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වහ වහා කළ යුතු දෙයකි.

බ්‍රිතාන්‍ය සමයේ කෙරුණු පුරාවිද්‍යා කැණීම් ස්වල්පයක් සහ මෑත භාගයේ චාර්ල්ස් ගොඩකුඹුරේ විද්වතුන් සමයේ කළ කැණීම් හැරුණු විට ලංකා රජය මේ ගැන උනන්දුවක් නොදැක්වීමේ අනිසි විපාක අපි අද විඳිමු. කාලිංග මාඝ, චෝල ආක්‍රමණයෙන් දහස් ගණන් සිද්ධස්ථාන විනාස කළාට පසු ඉතිරිව තිබූ බෞද්ධ නටබුන් වර්ත-මානයේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් විසින් නසනු ලැබ ඇත. විහාරාරාම තිබුණු ඇතැම් නටබුන් මත අද හින්දු කෝවිල් ඉදිකර තිබේ.

## අමතක කළ නොහැකි කරුණක්

මෙතැන්හිදී වෙසෙසින් සිහිපත් කළ යුතු වැදගත් කරුණක් ඇත. දන්ත ධාතූන් වහනසේ ශ්‍රීලංකාවට වැඩම කරවූ දන්ත කුමරු සහ හේමමාලා කුමරිය ගමන් ගත් බැව් සඳහන් වන දඹකොළ පටුන (වත්මන් කන්කසන්තුරය) සිට යාපන නගරය දක්වා වූ මග දෙපස බෞද්ධ පූජනීය ස්ථාන වලින් ගහණ වූ බව ප්‍රකටය. දඹකොළපටුන නැව්තොට සිට චූලපුර, ගොතමළුවත්ත, චන්දන, කදුරුගොඩ, සංඝාරාම, උඩුවිල, පරණ නාගවිහාරය වැනි ඉපැරණි ගම් ඉන් සමහරකි. ඇතැම් විට ඊට පෙරද සංඝමිත්තා මෙහෙණිය සිරිමා බෝ සමිඳුන් වැඩම කළේ එමගින් විය යුතුයයිද අනුමාන කරති.

## යාපනයේ බෞද්ධ ස්ථාන සිතියම

මෙහි පසෙක සඳහන් කරන ලද වෙබ් අඩවියට පිවිසි විගසින් එහි සිංහළ ස්ථාන නාම ලැයිස්තු වට ඉහළින් දක්වා ඇති කෙටි හැඳින්වීම අනුව එක් එක් අතුරුජාල පිටු විවෘත කරත්ම උතුරු හා නැගණහිර පළාත් දෙකෙහි පවත්නා හා පැවති අප්‍රමාණ බෞද්ධ සිද්ධස්ථානයන් හඳුනාගත හැකි වේ. හඳුනාගැනීමේ පහසුව තකා එහි සඳහන් කර ඇති යාපනයේ බෞද්ධ සිද්ධස්ථාන යනුවෙන් දක්වා ඇති සිතියමේ තිල්පාට අකුරින් (දැනට ඇත්තේ ඉංග්‍රීසි අක්ෂරයෙන් පමණි) උතුරුකරයේ බෞද්ධ සිද්ධස්ථානයන් පෙන්වා තිබේ.

යාපාපටුනේ බෞද්ධ නටබුන් අතුරෙන් කදුරුගොඩ විහාරයේ තවමත් ඉතිරිව ඇති නටබු-න් වූ දාගැබ් සංඛ්‍යාව (60) හැටකි. පිරිනිවන් පෑ රහතුන් වහන්සේලාගේ භස්මාවශේෂ හෝ ශාරීරික ධාතු ඒවායේ තැන්පත් වන්නට ඇත යනු ජනප්‍රවාදයයි. එහි දක්නට ලැබෙන වටදාගෙයක වත්මන් ඡායාරූපයක් ද මෙහි පසෙක පළවේ. කදුරුගොඩ යන්න මෑත කාලයේ දෙමළට හරවා '**කත්තරෝඩෙයි** ' යනුවෙන් ව්‍යවහාර කෙරේ. මෙම ඓතිහාසික සිද්ධස්ථානයේ නටබුන් දෙමළ ත්‍රස්ත-වාදීන්ට විනාශ කරගත නොහැකිව තවමත් පැවතීම ම විෂ්මයජනකය.

## දෙමළ ඊළාම් වාදය පරාජය කරමු

මෙහි දකුණු පස සඳහන් කර ඇති අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසෙන්නැයි සියළුම සිංහළ දේශප්‍රේමීන්ගෙන් අපි ඉල්ලා සිටිමු. එසේම එහි දැක්වෙන සිංහළ ස්ථාන හා ග්‍රාම නාම හැමදා හැම තන්හිදීම භාවිතාකරන මෙන් ද ඉල්ලමු.

එමෙන්ම ශ්‍රීලංකාවේ රාජ්‍යපාලකයින්, රාජ්‍ය සේවා වන්හි නියුක්තවූවන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, ප්‍රාදේශීය පාලන කෙෂත්‍ර, පත්‍රකලාවේදීන්, වාර්තාකරුවන්, ලේඛකයින්, සාහිත්‍යධරයින්, පාඨශාලා ශිෂ්‍ය හා ශිකෂකයින්, ගුවන්විදුලි හා රූපවාහිනී නිවේදකයින්, මේ ආදී ශ්‍රීලංකා ජනසන් නිවේදන කෙෂත්‍රයට හසුවන සෑම තරාතිරමකම ජාතිමාමක සියළු දෙනාගෙන්ම මෙම වැදගත් අවශ්‍යතාව නොපිරිහෙළා ඉටුවනු ඇතැයි අපගේ ඒකායන අපේකෂාවයි.

මේ අනුව දෙමළ ඊළාම් සංකල්පය මත උපන්, අප රටට විනකරන සියළු සතුරු ව්‍යසන පරාජය කරමු. දෙමළකරණයට ලක්වී ඇති දිවයිනේ සමස්ථ සිංහළ නාමයන් හඳුනාගෙන ඒවාට මුලින් තිබූ සිංහළ නාමයන්ම භාවිතාකිරීම අදම අරඹමු. එසේ කිරීම කිසි ලෙසකින් ජාතිවාදයක් නොවේ.

තවද දෙමළ ජනතාවට සිය දෙමළ භාෂාමය ස්වරයෙන් උච්චාරණය කළ හැකි පරිද්දෙන්ම ඉදිරියටද ඒ ඒ ස්ථාන නාමයන් ශබ්දකිරීමට හෝ ලිවීමට හෝ මෙයින් කිසිදු බාධාවක් නොවන බව ද සැලකිය යුතුය. සිංහළයින් ඈත අතීතයේ සිටම සෙසු ජාතීන්ගේ සංස්කෘතිය, බස, ජීවන රටා, ඇදහිළි හා වත්පිළිවෙත් සමතන්හිලා ගරු කළ

## http://www.geocities.com/place.names/index.html

මිනිසුන් බව මුළු ලොවම දනී. ශ්‍රී ලංකාව නොහොත් සිංහලේ හැරුණු විට රටේ ජනගහනයෙන් සියයට 9 ක් පමණ වූ සුළුතරයකට එහි බහුතර (75%) පුරවැසියන්ට හිමි සියළුම අයිතීන් හා වරප්‍රසාද කෙරෙහි වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම '**සමතැන්**' පිරිනමා ඇති (බසට පමණක් නොවේ) වෙනත් කවර නම් දැයක් හෝ රටක් ලොව වේද? නැත්තේ ම ය!

අප ආදරණීය ලක්මව දිනේවා!

♦ *ආනන්ද විජේසිංහ*
**Lethbridge - Canada**



යාපනයේ කදුරුගොඩ නම් ග්‍රාමයේ අදත් දක්නා බෞද්ධ ස්තූප 60 ක් ඇත. කදුරුගොඩ දෙමළෙන් කත්තරෝඩ යනුවෙන් අද හැඳින්වේ.

1 වෙනි පිටුවෙන්

## තෙලේ බලේ ......

සෞඛ්‍යය ආදිය සඳහා යෙදවිණ. නමුත් පසුකාල වලදී නයිජීරියාවට හමුදා පාලන වලටද යටත් වීමට සිදුවීය. ක්‍රමයෙන් දූෂණය ඉහවහා යන්නට වූ අතර එම තෙල් බලයෙන් පාලකයන් තරවීම ඇරඹිණ. විශාල ධන සම්භාර රටේ පාලකයන්ගේ ස්විස් බැංකු ගිණුම් වලට ඇදුණු අතර ජනතාව එන්න එන්නම දරිද්‍රතාවෙන් පෙළෙන්නට වූහ. අද එහි ඇති නැති පරතරය ඉතා විශාලය. අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවය අන්තයට ම පිරිහී ඇත. සොර-කම්, තක්කඩිකම්, දූෂණය, වංචාව ඉහ වහා ගිය රටක් වශයෙන් නයිජීරියාව අද අති ප්‍රසිද්ධය. තෙලේ බලේ නරක අතට ගිය විට වන දේ මෙයයි.

## චාවේස් (CHAVEZ ) සහ වෙනිසියුලාව

වෙනිසියුලාව දකුණු ඇමරිකාවේ ඛණිජ සම්පත් බහුල ම රටයි. එම රට කාලයක් එක්සත් ජනපද ආධිපත්‍යයට යටත්ව ඇමරිකාවට ගැතිකම් කළ ඒකාධිපතියන්ගේ පාලනයන් යටතේ දිගින් දිගටම පැවතිණ. එහි තෙල් සම්පත් ඇමරිකානු සමාගම් විසින් හසුරුවනු ලැබිණ. වසර 500 කට පමණ පෙර ස්පාඤ්ඤකාරයින් විසින් යටත් විජිතයක් ලෙස පවත්වාගෙන ගිය මෙහි ස්පාඤ්ඤ, ඉතාලි ආදී යුරෝපීයයන්ගෙන් පැවතෙන සුළු කොටස කින්ද, රටේ මුල් වැසියන් වූ දකුණු ඇමරිකානු වන් වැඩි කොටසකින් ද සමන්විත ජනගහනයකි. නමුත් හම සුදු ස්පාඤ්ඤ ජාතික ටිකදෙනා අතර ධනබලය හා පාලන බලය පැවති අතර, පුවත්පත්, ජනමාධ්‍යය ආදී සියල්ල ද, වෙළඳ ව්‍යාපාර හා වෙළඳ සමාගම් සියල්ල ද ඔවුන් අත වීය. එසේම සුළු පිරිස වූ මොවුන් ඇමරිකා එක්සත් ජනපදයට ලෙන්ගතුව රටේ ධනය පරිහරණය කළෝය. ඉතා වැඩි පිරිස වූ හම සුදුනැති දේශීය මුල් වැසියෝ දුක්ඛිතව දරිද්‍රතාවෙන් පෙළෙන්නෝ වූහ.

1998 දී පැවති ඡන්දයෙන් මේ සියල්ල වෙනස්වීම ඇරඹිණ. එයට පෙර හමුදා නිලධාරියෙකු වූ හියුගෝ චාවේස් අති බහුතර ඡන්දයකින් වෙනිසියුලාවේ ජනාධිපති වශයෙන් පත්විය. ඔහුගේ ප්‍රධාන ම ඡන්ද පොරොන්දුව වූයේ රටේ තෙල් ආදායම නියම වශයෙන්ම රටේ බහුතර ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා වියදම් කරන බව ය. චාවේස් එම පොරොන්දුව අකුරටම ක්‍රියාත් මක කරමින් එම තෙල් සම්පත් රජය යටතට ගෙන එහි ආදායම ජනතාව වෙනුවෙන් වියදම් කරන්නට පටන් ගත්තේ ය.



Hugo Chavez

එයට පෙර බලයේ සිටි කණ්ඩායම් ද, ඇමරිකාව ද මේවා තදින්ම නොරිස්සූහ. රටේ මාධ්‍යයන් සියල්ල මෙම ධනපතීන්ට අයත්වූ බැවින් චාවේස්ගේ සියළු කටයුතු වලට සතුරුකම් මුල සිටම ඇරඹිණ. ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය මාධ්‍යයන් ද මේ ප්‍රහාරයන්ට එක්වූහ. අදත් එසේම ය. ඇමරිකානු ජනාධිපති බුෂ් සහ සී. අයි. ඒ. ඔත්තු සේවාව ද, මේ ධනපති කණ්ඩායම් ද එක්වී කරන ලද කුමන්ත්‍රණයක් මගින් 2002 දී ජනාධිපති මන්දිරය හමුදාවේ කල්ලියක් විසින් වටලා චාවේස් පැහැර ගෙන යන ලදී. වහාම පාර්ලිමේන්තුව සහ සියළු පරිපාලන යන්ත්‍ර තහනම් කොට යුද්ධ නීතිය පැනවිණ.

නමුත් මේ සියළු තර්ජනයන්ට එරෙහිව නැගී සිටි වෙනිසියුලානු ජනතාව සිය ජීවිත පවා නොතකා එකා මෙන් ලකෂ ගණනින් වීදි බටහ. ධනපතියනට කත් අදින මාධ්‍යය සහ ඇමරිකානු ගැති මධ්‍යම සහ සුළු ධනේශ්වර පන්තිය මොනවා කීවද ඒවා සුළඟේ ගියා වැනිවිය. මේ බලවේගයට තැතිගත් යුද හමුදා කල්ලිය චාවේස් නිදහස් කළේය. ඔහු නැවත ජනතාව අතරට පැමිණ රටේ පැවති පාර්ලිමේන්තු ක්‍රමය සහ පරිපාලනය නැවත පිහිටුවා ජනතා සේවය ඉදි-රියට ගෙනයෑම නැවත ඇරඹී ය. ඒවා දැනුදු නොනවත්වා කරගෙන යයි.

2003 දී ඉහළින් පිළිගනු ලබන ඇමරිකානු සමීකෂණ කණ්ඩායම් දෙකක් වෙනිසියුලාව ගැන කළ සමීකෂණ ප්‍රථිඵල අනුව චාවේස් පාලනය යටතේ රටේ ඇතිවූ සමාජීය සහ ආර්ථික වෙනස්වීම් රාශියකි. ඉන් කීපයක් මෙසේ ය.

අඩු ආදායම් ලබන ජනගහ යෙන් 50% කගේ (උද්ධමන බලපෑම් ඉවත් කළ විට) නියම ආදායම 130% කින් වැඩි වී ඇත. පිරිසිදු ජල පහසුකම් 91% කට ලැබෙන අතර, සෞඛ්‍ය පහසුකම් වැඩිවීම ඉමහත්ය. 1998 දී ප්‍රාථමික වෛද්‍ය සේවා වන් සඳහා වෛද්‍යවරුන් මුළු රටටම වූයේ 1628 කි. 2003 වන විට එය 19,571 විය. දස ගුණයකටත් වඩා වැඩිවීමකි.

නිර්ධන පන්තියේ බොහෝදෙනා ඉන්පෙර කිසිදා නොලද පරිදි අධ්‍යාපන සෞඛ්‍ය සාමාජීය පහසුකම් ලබන්නට වූහ. අද වෙනිසියුලාව ලතින් ඇමරිකාවේ ඉතා වේගයෙන් ඉදිරියට යන රටක් වෙයි. හතුරුකම් කළ කණ්ඩායම් වලින් චාවේස් පලිගත්තේ නැත. ගිය වසරේ පැවති ඡන්දයෙන්ද 62% ක් ලබා ඔහු තව ඉදිරි පස් වසරකට ජනපති බලය ලබා ඇත.

මේ දැක්වූයේ තෙල්වල බලය එහි සත්‍ය උරුමක්කාරයන් වන රටේ මුළු මහත් ජනතාවගේ යහපත සඳහා යෙද වීමේ උදාහරණයකි.

ලංකාවේ අසල්වැසි රටක්වන මැලේසියාව ද මෙසේම ඛණිජ තෙල් සම්පත් ඇති රටකි. මහතීර් මොහොමඩ් වැනි නියම දේශප්‍රේමී නායකයින් යටතේ එහි තෙල් සම්පත් නියම මග යවමින් මැලේසියාව ද අද ලෝකයේ සීඝ්‍රයෙන් ඉදිරියට යමින් සිටී. මේවා අප උදාහරණ යට ගත යුතු රටවල් ය.

ඛණිජ තෙල් සම්පත් ගවේෂණය කරන්නට සූදානම් වන අප වැනි රටවල් මේ ඉහත සඳහන් කළ දේවලින් උගතයුතු පාඩම් කීපයකි. ඒවා නම්:

❋ තෙල් සම්පත යම් තැනකද, එතැනට ලෝක අධිරාජ්‍යවාදීන්ගේ උකුසු ඇස් වහා යොමුවේ. ගවේෂණ ආදී කටයුතු සඳහා ඔව්හු ආදරයෙන් ඉදිරිපත් වෙති. උන් එසේ ඉදිරිපත් වන්නේ අපට ඇති ආදර යෙන් නොවේ. උන් කවදාවත් ඒ රටේ යහපතට ඒවා කරන්නේ නැත. ඒ සඳහා ඒ වෙනුවට අප එම තාකෂණ දැනුම ඇති අධිරාජ්‍ය විරෝධී මිත්‍ර රටවල් සහාය කරගත යුතු ය. අප රට මුල් අවධියේ කළ වැරදි මග හරිමින් නියම මගට බැස සිටීම සතුටට කරුණකි.

❋ තෙල් ධනය ලැබෙන විට විදේශීය හා දේශීය අවස්ථාවාදීන්, තක්කඩියන්, දූෂිත යන් පාලකයින් වටා රොක්වේ. මුන් පැණි හැලියට රොක්වන ඇඹිලයන් වැනිය. ධනය ලැබෙන විට පාලකයින් පවා බොහෝ විට දූෂණයට යොමුවේ. එම බල වේග වලට යට නොවී තෙල් බලය මනාව හැසිරවීම වැදගත් වෙයි. මක්නි සාද ධනය දූෂණයට නැඹුරුවීමේ මුල බැවිනි.

❋ එම තෙල් බලය මුළු මහත් ජාතියේ යහපත සහ අනාගත දියුණුව සඳහා යෙදවිය යුතු ය. **තෙල් බලය**, **ධනබලයට** නොව, **ජන බලයට** හැරවිය යුතු ය. එසේ කළ විට එම රජය කවරදාවත් බිඳ දැමිය හැකි නොවේ.

♦ *වකුල ගුණපාල*
**Ilford Essex UK**